**රබර් නැවත වගා සහනාධාර අරමුදල - 2014**

රබර් නැවත වගා සහනාධාර අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1953 අංක 36 දරන රබර් නැවත වගා සහනාධාර අරමුදල් පනතේ (437 අධිකාරිය) 6 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැළපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය ව්‍යාවනය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඒකාබද්ධ අරමුදලට බැරකර තිබූ රු. 70,659,527 ක් රබර් නැවත වගා සහනාධාර අරමුදලෙන් අඩුකර දක්වනවා වෙනුවට එය ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි.

(ආ) 2010 වර්ෂය දක්වා විගණන ගාස්තු බිල්පත් පියවා තිබියදී අරමුදල විසින් ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විගණන ගාස්තු වශයෙන් රු.1,181,126 ක් ප්‍රතිපාදනය කර තිබුණි. නමුත් වර්ෂයකට රු. 40,000 ක් බැගින් 2011 සිට 2014 දක්වා වූ වර්ෂ හතර සඳහා කළ යුතුව තිබුණු ප්‍රතිපාදනය රු.160,000 ක් වුවද රු.1,021,126 ක් වැඩිපුර ප්‍රතිපාදනය කර තිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් සනාථ කර ගැනීම සඳහා අදාළ කර ගත හැකි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| **(අ)** | **ස්ථාවර වත්කම්** | **17,766,770** | මෙම වත්කම් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ භාවිතය සඳහා වර්ෂ 17 කට පෙර ලබාදී ඇති බව විගණනයට දන්වා ඇතත් එම වත්කම් ඇතුලත් ලේඛනයක් හෝ භෞතිකව පවතින බවට සාක්ෂියක් ඉදිරිපත් නොකෙරිණි. |
| **(ආ)** | **ජංගම වත්කම්** | **102,158,631** | (i). විවිධ කටයුතු සඳහා ලබා දී තිබූ වර්ෂ 17කට වැඩි කාලයක සිට පරිශේෂව පැවත එන එකතුව රු.15,220,514 ක් වූ අත්තිකාරම් ගිණුම් 12 ක ශේෂ සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු හා ඒවා අයවිය යුතු පාර්ශවයන්ගේ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරිණි. |

(ii). මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු.17,066,956 , රේගු දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.286,059 ක් සහ යුධ හමුදාවෙන් ලැබිය යුතු රු.4,260 ක් අදාල ආයතන විමසීමෙන් තොරව වර්ෂ 17 ක් තිස්සේ ජංගම වත්කම් ලෙස ඉදිරියට ගෙන එන අතර එම ශේෂ සත්‍ය වශයෙන්ම ලැබිය යුතුව පවතින බව තහවුරු කර ගැනීමට අදාල කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(iii). ආයෝජනය කළ මුදල් හා පොලී මුදල් සමාලෝචිත වර්ෂයේදි ආපසු ලබාගෙන ඒකාබද්ධ අරමුදලට බැරකර තිබුණද වර්ෂ 17 ක් තිස්සේ ගිණුම්වල දැක්වෙන රු.102,890 ක් වූ ලැබිය යුතු ආයෝජන පොලිය නිරවුල් කර ගෙන ඇති බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොකෙරිණි.

(iv). සමූහ සැකසුම් මධ්‍යස්ථාන සඳහා ලැබීම් සහ ව්‍යාපෘති අංක 02 යන ගිණුම් දෙකට අදාල පිළිවෙලින් රු.3,647,219 ක් හා රු.65,477,579 ක් වූ ශේෂ පිළිබඳ ලිඛිත සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(v). වර්ෂ 17 ක් තිස්සේ ලැබිය යුතු මුදලක් ලෙස ඉදිරියට ගෙන එන රු. 1,800 ක තැපැල් අග්‍රිමය ලබාගත් තැනැත්තා නිශ්චිතව හඳුනා ගෙන නොතිබුණි.

vi වර්ෂ 17 ක් තිස්සේ ජංගම වත්කම් ලෙස ඉදිරියට ගෙන එමින් පැවති අයකර ගැනීම සම්පූර්ණයෙන්ම අවිනිශ්චිත එකතුව රු.351,353 ක් වූ ගිණුම් 05 ක ශේෂය වත්කමක් ලෙස හඳුනාගැනීමට හේතු පැහැදිලි නොවුණි.

**ජංගම බැරකම්** **18,868,119**

(i). වර්ෂ 17කට වැඩි කාලයක සිට ගිණුම්වල ඉදිරියට ගෙනැවිත් තිබුණු රු.9,988,530 ක විවිධ තැන්පතුවලට අදාල ලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(ii). ඒකාබද්ධ අරමුදලේ අත්තිකාරම් යනුවෙන්

නම් කළ රු. 483 ක ප්‍රායෝගික නොවන ශේෂයක් වර්ෂ 17කට වැඩි කාලයක සිට ගිණුම්වල ඉදිරියට ගෙන ඒම සම්බන්ධයෙන් විගණනයට සාක්ෂි ඉදිරිපත් නොකෙරිණි.

(iii). ලැබිය යුතු පාර්ශව පිළිබඳ තොරතුරු කිසිවක් නොමැති වර්ෂ 17 කට වැඩි කාලයක සිට පරිශේෂව පැවත එන වෛද්‍යාධාර ණය රු.57,526 ක් හා වෙනත් දෙපාර්තමේන්තු ණය රු.416,313 ක් පොත්වලින් ඉවත්කිරීමට කටයුතු නොකිරීමට හේතු විගණනයට ඉදිරිපත් නොවුණි.

(iv). එකම කළමනාකරණයක් යටතේ පැවතියද, රබර් පාලන අරමුදලට ගෙවියයුතු රු.281,210 ක් හා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.15,449 ක් ගෙවා නිරවුල් කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග විගණනයේදී අනාවරණය නොවුණි.

(v). ගෙවිය යුතු නිශ්චිත පාර්ශවය හා වටිනාකම හඳුනාගෙන තිබුණද, රු.22,087ක් රබර් පර්යේෂණායතනයට ගෙවා නිරවුල් කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග විගණනයට අනාවරණය නොවුණි.

(vi). වර්ෂ 17 කට පෙර සිට කිසිදු සේවකයකු සේවයේ යොදවා නොමැති නමුත් ගෙවිය යුතු නිශ්චිත පාර්ශවයක් සඳහන් නොවන රු.90,706 ක් වූ සේවක පාරිතෝෂික බැඳීමක් ජංගම බැරකම් යටතේ දැක්වීම විගණනයේදී සෑහීමට පත්විය නොහැක.

(vii). පැල අත්තිකාරම් සහ පරිනත වගාවට පොහොර යනුවෙන් නම් කළ, පිළිවෙලින් රු.119,550 ක් හා රු.4,779,564 වූ ශේෂ දෙකක් වර්ෂ 17 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන අතර ඒවාට අදාල ලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(viii). අරමුදලට අයත් නොවන ණය ලැබීම් යනුවෙන් සඳහන් රු.3,096,701 ක් ජංගම බැරකමක් ලෙස දක්වා තිබුණද, එම අසාමාන්‍ය බැඳීම ඇතිවීමට හේතුව හෝ එම මුදල් ගෙවිය යුතු පාර්ශව කවරේද යන්න පිළිබඳ තොරතුරු හෝ විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලට අයත් ස්ථාවර තැන්පතු සඳහා රු. 497,051 ක පොළී ආදායමක් ලබා තිබුණු අතර එය අරමුදලේ එකම ආදායම් ප්‍රභවය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 9,307,910 ක්වූ අදාල ස්ථාවර තැන්පතුව ආපසු ලබාගෙන ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණු බැවින් තවදුරටත් අරමුදලේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වයක් නොපැවතුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 අරමුදලේ ක්‍රියාකාරකම් පිළිබඳ වර්තමාන තත්ත්වය

රබර් නැවත වගා සහනාධාර අරමුදල දැනට ක්‍රියාකාරීත්වයේ නොපවතින බැවින් වර්ෂයක කාලයක් තුළ අරමුදලේ ඇවර කිරීමේ කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කරන බවට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2014 ජූලි 04 දිනැති අංක RDD/02/10/ඇවර(නැ.ව) දරන ලිපිය මඟින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ට දන්වා තිබුණු අතර 2014 දෙසැම්බර් 01 දින ශේෂ නිරවුල් කිරීමේ කමිටුවක් ද පත් කර තිබුණි.එම කමිටුවේ නිර්දේශ මත අරමුදලට අයත්ව තිබුණු ස්ථාවර වත්කම් හා ආයෝජන ගිණුම්වල ශේෂ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට පැවරීම පමණක් සමාලෝචිත වර්ෂයේදී සිදු කර තිබුණු අතර ඉතිරි වත්කම් හා වගකීම් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ